**ශීර්ෂය - 263 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුවූ රු.1,919,028ක මුදල් සොරකමට ඇතුළත් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළයුතු රු.75,669ක්වූ රැස් කළ ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ශේෂවල නිවැරදි වටිනාකම් හෙළිදරව් වන පරිදි ගිණුම් ගත කළ යුතුය. |

**(ආ) පුනරාවර්තන වියදම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 8(4)(i) අනුව මූලධන වියදම් හා පුනරාවර්තන වියදම් ලෙස වැය විෂයයන් කාණ්ඩගත කර ප්‍රමිතිකරණය කරනු ලැබ ඇති අතර, ඒවා වෙනස් නොකළ යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඒ කෙරෙහි අවධානය යොමු නොකර අවස්ථා 7කදී එකතුව රු.235,485ක් වැය විෂයයන් මාරුකර ගිණුම්ගත කර තිබුණි. | පෙන්වා දී ඇති වැය විෂයය මඟින් ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව. | විෂයයන් කාණ්ඩගත කර ප්‍රමිතිකරණය කර ඇති ආකාරයට ගිණුම්ගත කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාවේ පුටු අලුත්වැඩියා කිරීම වෙනුවෙන් අවස්ථා තුනකදී ගෙවන ලද එකතුව රු.1,072,000කින් රු.335,000ක් වෙනත් වියදම් (සැපයීම් ) වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණු අතර, රු.737,000ක් වෙනත් වියදම් (සේවා) විෂයය යටතේ සදොස් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ඇස්තමේන්තු සකස් කිරීමේදී පෙන්වා දී ඇති වැය විෂයය මඟින් ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව. | - එම - |

**(ඇ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ වායු සමීකරණ යන්ත්‍රවල ප්‍රාග්ධන ස්වභාවයේ අලුත්වැඩියා සඳහා දරන ලද එකතුව රු.4,143,000ක වියදම් ප්‍රාග්ධන වැය යටතේ ගිණුම්ගත නොකර අයහාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පෙන්වා දී ඇති වැය විෂයය මඟින් ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව. | විෂයයන් කාණ්ඩගත කර ප්‍රමිතිකරණය කර ඇති ආකාරයට ගිණුම්ගත කළ යුතුය. |

**(ඈ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නොවන ගොඩනැගිලි 03ක වටිනාකම වූ රු.24,223,031ක් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් වටිනාකමට ඇතුළත් කර තිබුණි. | සිගාස් පද්ධතියෙන් හා මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව. | වත්කම්වල නිවැරදි වටිනාකම හෙළිදරව් වන ආකාරයට ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | භාණ්ඩාගාර ලේකම්ගේ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කළයුතු වුවත්, ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.3,492,009ක් වැය කර ඉදිකර තිබුණු නිල සෙවන ගොඩනැගිලිවල වටිනාකම්, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු යතුරු පැදියක සහ අම්බලන්තොට, සූරියවැව හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවත්වාගෙන යන සේවා පියස ගොඩනැගිලි හා ඉඩම් 50ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ නිලධාරින්ට දැනුම් දි ඇති අතර තක්සේරු වටිනාකම් ලබා ගැනීමෙන් පසුව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව සහ යතුරු පැදියේ වටිනාකම සිගාස් වැඩසටහනට ඇතුළත් කර ඇති බව. | - එම - |

**(ඉ) විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක මූල්‍ය නොවන වත්කම් ලෙස සිගාස් පද්ධතියේ ඇතුළත් කර තිබුණු එකතු වටිනාකම රු.157,958,957ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් සනාථ කිරීම සඳහා අදාළ පිරිවැය / තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. | තක්සේරු පිළිබඳ තොරතුරු තහවුරු කරගැනීමෙන් පසුව විගණනය වෙත ඉදිරිපත් කරන බව. | වත්කම්වල වටිනාකම් ගිණුම්ගත කිරීමට පදනම් කරගත් මූලාශ්‍ර ලියවිලි ඉදිරිපත් කලයුතුය. |
| (ii) කෘෂිකර්ම අමාත්‍යාංශයේ රු.17,910,000ක ප්‍රතිපාදන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නගාසිටුවීම වෙනුවෙන් ගෘහාශ්‍රිත එළවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද අනුමත ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය, සතුන් සැපයීම වෙනුවෙන් ගෙවූ රු.2,267,791කට අදාළ ගිවිසුම්පත්‍ර, ප්‍රතිලාභීන්ගේ අත්සන් ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. | නිරීක්ෂණ සඳහා පිළිතුරු කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් හරහා විගණනය වෙත ඉදිරිපත් කරන බව. | අදාළ විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කලයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේ ඉටුකර තිබුණු ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් එම වර්ෂයේදී බැරකම් ලෙස හඳුනා නොගෙන, සමාලෝචිත වර්ෂයේදී මු.රෙ. 66 සහ 217ට පටහැනිව, මාරු පත්‍රයක් මගින් මූලධන වත්කම් අත්පත් කර ගැනීම් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයයෙන් වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු වෙනත් මූලධන වියදම් වැය විෂයයට මාරු කර රු.1,098,486ක් ගෙවා තිබුණි. | මෙ සම්බන්ධයෙන් අයවැය අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයෙන් විමසීම් කිරීමේ දී මු.රෙ. 66 අනුව ප්‍රතිපාදන පවතින වැය ශීර්ෂයක් මඟින් ප්‍රතිපාදන මාරු කරගන්නා ලෙස වාචිකව උපදෙස් ලැබුණි. එම අනුමැතිය මත මාරු කර ඇති බව. | මුදල් රෙගුලාසි 217හි සහ මුදල් රෙගුලාසි 66හි විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2023 පෙබරවාරි 09 දිනැති අංක DFD/2023-1 දරන චක්‍රලේඛයේ 4.2 ඡේදය අනුව වී මිලදී ගැනීමේ මෙහෙයුම් වියදම් නොවන රු.1,021,180ක් වී මිලදී ගැනීමේ මෙහෙයුම් වියදම් යටතේ වැයකර තිබුණි. | පරිපාලන සංකීර්ණයේ අත්‍යාවශ්‍ය නඩත්තු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගෙන රජයට වාසිදායක ලෙස කටයුතු කර ඇති බව. | ප්‍රතිපාදන වෙන්කර ඇති කාර්යයන් සඳහා පමණක් යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ලුණුගම්වෙහෙර නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ රු.13,828,552ක් වූ අවසන් බිල්පත විගණිත දිනය වූ 2024 අප්‍රේල් 03 දිනවන විටත් මුදල් ගෙවා නොතිබුණු බැවින් බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | රු.13,828,552 ක් වූ අවසන් බිල්පත කොන්ත්‍රාත්කරු විසින් 2023.12.31 දින දිස්ත්‍රික් ඉංජිනේරු (ගොඩනැගිලි) වෙත ඉදිරිපත්කර ඇති නමුත් ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර නොමැති හෙයින් බැරකම් සඳහා ඇතුළත් කර නොමැති බව. | බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ හම්බන්තොට සංචාරක බංගලාව අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.4,255,852ක ගෙවීම් වාර්තාවක් සකස්කර මු.රෙ.137,138,139, 237(අ) (i) සහ 215(3) (අ) හි විධිවිධානවලට පටහැනිව බිල්පත් මුදලින් සියයට 50ක රැඳවුම් මුදලක් තබාගෙන මුදල් ගෙවා තිබුණි. ප්‍රමාද කාලය වූ දින 53ක් වෙනුවෙන් රු.89,154ක ප්‍රමාද ගාස්තු අයකළ යුතුව පැවතුණි. | කොන්ත්‍රාත්කරු විසින් ඉටුකර ඇති වැඩ කොටස්වල අඩුපාඩු හා වර්ෂය අවසානය බැවින් අවිච්ඡේද සඳහා මුදල් ලබාගැනීමට ඇති අපහසුතාවය හේතුවෙන් බිල්පත් පරීක්ෂා කර ගෙවීම් සඳහා නිර්දේශ කර එවා ඇත. Substantially Completion මට්ටමට වැඩ අවසන් කර තිබුණු බැවින් අවසාන බිල්පතින් කොටසක් රඳවාගෙන ඉතිරි මුදල් පමණක් ගෙවීමට නිර්දේශ කරන ලද බව. | මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන අනුව ඉදිකිරීම් කටයුතු කර ඇති බව තහවුරු වීමෙන් පසු ගෙවීම් අනුමත කිරීම සහතික කිරීම සහ ගෙවීම් කළ යුතුය. ප්‍රමාද ගාස්තු අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වර්ෂයේ ප්‍රතිපාදන මත තංගල්ල නගර සභා ක්‍රීඩාංගනයේ ක්‍රීඩාපිටිය හා ආරක්ෂිත වැට සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා නිවැරදි රේටයන් යොදා නොගැනීම හේතුවෙන් රු.107,374ක් වැඩිපුර ගෙවා තිබුණි. විදුලි පද්ධතිය සඳහා රු.211,144ක් වැයකර තිබුණද, 2024 මාර්තු 05 දින වන විටත් ක්‍රියාකාරි තත්ත්වයේ නොපැවතුණි. රු.36,020ක් වටිනා බල්බ 4ක් ක්‍රීඩාංගණයේ නොතිබුණි. | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සකස් කිරීම, අධීක්ෂණය, ගෙවීම් බිල්පත් ඉදිරිපත් කිරීම තංගල්ල නගර සභාව විසින් සිදුකර ඇති අතර, මේ සඳහා පිළිතුරු ඉදිරිපත් කරන ලෙස නගර සභාව වෙත ඉදිරිපත් කර ඇති බව. | ඇස්තමේන්තු හා ගෙවීම් වාර්තා නිවැරදිව සකස් කර වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය. ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගත යුතුය. |
| (ඇ) | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ ප්‍රතිපාදන මත හම්බන්තොට නිලධාරී විවේකාගාරය පිහිටි ඉඩම වටා වැට ඉදිකිරීම වෙනුවෙන් රු.237,089ක් වැඩිපුර ගෙවා තිබුණි. | රට තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් යන්ත්‍ර යොදා ගැනීමේ අපහසුතාවය හා පිරිවැය වැඩිවීමේ අවදානම සහ ඉඩමේ මීට පෙර පාත්ති සකස් කර වගාකර තිබුණ හෙයින් යන්ත්‍ර භාවිතයේදී වැඩිකාලයක් ගතවිය හැකි බැවින් හස්ත රේට යොදාගෙන ඇති බව. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. |
| (ඈ) | 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති දෙකක පරීක්ෂාවට ලක්කල කැටගල්වලින් සියයට 25ක් තත්ත්ව පරීක්ෂාව අසමත්ව තිබියදී, එම මාර්ග දෙකෙහි කැටගල් ඇතිරීම වෙනුවෙන් එකතුව රු.724,503ක් වූ සම්පූර්ණ මුදල ගෙවා තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ලබාදී ඇති උපදෙස් වලට අනුව ව්‍යාපෘතිවලට ගෙවීම් කරන ලද බව. | කාර්යයන් ඉටුකළ බව පරීක්ෂා කර ගෙවීම් කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| | XIX වැනි පරිච්ඡේදයේ 5 වැනි වගන්තිය | 299,408 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 02ක් වෙනුවෙන් එකතුව රු.299,408 ක් වූ නිවාස කුලී අයවිය යුතුව පැවතුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | විධිවිධාන අනුව නිවාස කුලී අයකළ යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | (i) මු.රෙ.137(5) සහ 237(ආ) | 54,738,096 | යොමුගත රෙගුලාසිවල විධිවිධානවලට පටහැනිව තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන නියමු ව්‍යාපෘතිය හා ආහාර සුරක්ෂිතතාවය හා තාක්ෂණය ව්‍යාපෘති සඳහා ගෙවීම් අනුමත සහ සහතික කර එකතුව | තොග සැපයුමෙන් අනතුරුව චෙක්පත් නිදහස් කර ඇති බව හා විසිරුම් ජල සම්පාදන පද්ධතිවල ඇති සුළු අඩුපාඩු සකස් කර චෙක්පත් නිදහස් කිරීමට කටයුතු කරන බව. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | රු.14,637,900ක් වූ සැපයීම් 2024 ජනවාරි 24 දින සිදුකර තිබුණු අතර, එකතුව රු.40,100,196ක් වූ සැපයීම් 2024 මාර්තු 28 දින වන විටත් සිදුකර නොතිබුණු බවද නිරීක්ෂණය විය. | | |
| (ii) | මු. රෙ. 215(3) (අ) | 437,886 | ආසන්න ගෙවීම් සඳහා මුදල් ප්‍රතිපාදනවලින් කොටසක් තැන්පත් ගිණුමට බැර නොකළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් 2023 වර්ෂයේ ඉටුකර තිබුණු “මැදකන්ද දොලේදෙනිය ඇලට බෝක්කුව ඉදිකිරීමේ ව්‍යාපෘතියේ” කොන්ක්‍රීට් පරීක්ෂණ වාර්තාවල අසමත් ප්‍රමාණ වෙනුවෙන් සියයට 15ක් වූ රු.437,886ක් රඳවාගෙන තිබුණි. | පාර කොටසෙහි කොන්ක්‍රීට් පරීක්ෂණ වාර්තා අසමත් වීම නිසා දිස්ත්‍රික් ඉංජිනේරුගේ නිර්දේශය සහිතව එම අසමත් කොටස සඳහා වූ මුදල නැවත නිවැරදි කරන තෙක් රඳවා ගන්නා ලදී. | ආසන්න ගෙවීම් සඳහා තැන්පත් ගිණුමට මුදල් බැර නොකළ යුතුය. |
| (iii) | මු. රෙ. 315 | 1,937,656 | යොමුගත රෙගුලාසියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුවී තිබුණු සොරකමක් හේතුවෙන් | සේප්පුවේ රහස් අංකය යෙදීම සම්බන්ධව පුහුණුව හා උපදෙස් ලබා දී ඇති අතර, පැවැති අඩුපාඩු නිවැරදි කරමින් රාජකාරී පැවැරීම් ලබා දී ඇත. ඉදිරියට මුදල් රෙගුලාසි ප්‍රකාරව | වත්කම්වල ආරක්ෂිතතාව තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | රු.1,937,656ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි. | කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | |
| (ඇ) | 2022 මාර්තු 08 දිනැති අංක 04/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.2(ii) ඡේදය | 624,192 | නිල රථ හිමි රාජ්‍ය නිලධාරීන් සඳහා මාසිකව හිමිවන ඉන්ධන ප්‍රමාණයට වඩා අතිරේක ඉන්ධන ලබාදීම තාවකාලිකව අත්හිටුවන ලෙස දක්වා ඇති නමුත් එයට අනුකූල නොවී, 2022 මාර්තු සිට 2023 දෙසැම්බර් දක්වා, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක නිල රථ හිමි නිලධාරීන් වෙනුවෙන් අමතර ඉන්ධන ලීටර් 1,894.64 ක් සඳහා එකතුව රු.624,192 ක මුදලක් ගෙවා තිබුණි. | අමතර ඉන්ධන අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා පමණක් ලබා ගෙන ඇති අතර ඒ සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන ඇති බව හා ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීම මත දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලැබීමෙන් පසු අතිරේක ඉන්ධන සඳහා ගෙවීම් කර ඇති බව. | චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | තුවක්කු ආඥා පනතේ 22(2) (උ) වගන්තිය හා ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ 2022 සැප්තැම්බර් 19 දිනැති අංක 02/2022 චක්‍රලේඛයේ 3.4 ඡේදය | | 2023 ජනවාරි 10 වන විට බලපත්‍ර ලබාගැනීමට නොහැකි වන සෑම ගිනි අවියක්ම තාවකාලිකව කාර්යාලය වෙත හෝ ආසන්නතම පොලිස් ස්ථානය වෙත භාරදිය යුතු බව බලපත්‍රලාභීන් දැනුවත් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, | 2023 වර්ෂය සඳහා ගිනිඅවි බලපත්‍ර අලුත් නොකල බලපත්‍රලාභීන් 25 දෙනා අතුරින් දෙදෙනෙකු 2024 වර්ෂය සඳහා බලපත්‍ර ලබා ගෙන ඇත. අනෙකුත් ගිනිඅවි බලපත්‍රලාභීන් සම්බන්ධව සොයා බලා වාර්තා කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් | තුවක්කු ආඥා පනත හා චක්‍රලේඛයේ උපදෙස් අනුව ගිනි අවි හා බලපත්‍ර සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | 2024 පෙබරවාරි 19 දින වන විටත්, 12 දෙනෙකු 2023 වර්ෂයට පෙර සිට ද 13 දෙනෙකු 2017 වර්ෂයත් 2022 වර්ෂයත් අතර වර්ෂ සඳහාද බලපත්‍ර අලුත් කරගෙන නොතිබුණි. | කර ඇති බව. |

**2.5 අවිධිමත් ගනුදෙනු**
**අධිකාර බලය නොමැති ගෙවීම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණයේ පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී සේවා සැපයුම් ආයතනය විසින් සේවයේ යොදවා නොතිබුණු කම්කරුවන් තිදෙනෙකුගේ නම් සාවද්‍ය ලෙස ඇතුළත් කර බිල්පත් සකස්කර එකතුව රු.238,256ක් වැඩිපුර ගෙවා තිබුණි. | නිරීක්ෂණයේ සඳහන් කම්කරුවන් දිස්ත්‍රික් ලේකම් නිල නිවසේ සේවය කල කම්කරුවන් වන අතර, ඒවා සනාථ කරමින් පවිත්‍රතා ආයතනයේ සුපරීක්ෂකවරුන් වාර්තා ලබාදී ඇති බව. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතු අතර, සාවද්‍ය බිල්පත් සකස් කර ගෙවීම් කිරීමට කටයුතු නොකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2021 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බැදිගම දකුණ වසමේ ප්‍රතිලාභින් 20 දෙනෙකු සඳහා කොහු බ්‍රෂ් ව්‍යාපෘතියක් වෙනුවෙන් රු.221,668 ක් වැයකර තිබුණද, 2023 ඔක්තෝබර් මාසය වන විට ඉන් ප්‍රතිලාභීන් 05 දෙනෙකු පමණක් ව්‍යාපෘතියේ යෙදී සිටින බවත්, ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බවත් නිරීක්ෂණය විය. | කොහු බ්‍රෂ් නිෂ්පාදනය සාර්ථකව සිදු කරනු ලබන වෙනත් සමිතියකින් කරන ලද ඉල්ලීම අනුව යන්ත්‍රය එම සමිතිය වෙත ලබාදී ඇති බව. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර තිබුණු සමෘද්ධි අරුණලු වෘත්තීය පුහුණු පාඨමාලාවෙන් වෘත්තීය පුහුණුව හා ව්‍යවසාය සංවර්ධනය මගින් විරැකියාව අඩුකිරීම අරමුණු වී තිබුණද, ප්‍රතිලාභීන් 48 දෙනෙකු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් විසින් රු.1,728,000ක් වැයකර වසර 02කට ආසන්න කාලයක් ගතවී ඇතත්, පුහුණු පාඨමාලාව හැදෑරූ සිසුන් 03 දෙනෙකු පමණක් ඒ ආශ්‍රිත රැකියාවල නිරතවන බව නිරීක්ෂණය වූ අතර, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් ව්‍යවසනය, රටේ පැවති ඉන්ධන හිඟය, ගෑස් හිඟය නිසා හොටෙල් ක්ෂේත්‍රය කඩා වැටීමකට ලක්විය. එම නිසා කුමන හෝ රැකියාවක නිරතවීමට පුද්ගලයින් යොමු විය. මේ වන විට හොටෙල් ක්ෂේත්‍රයේ ගොඩනැගීමත් දක්නට ලැබෙන බැවින් ඉදිරියේදී එම පුහුණුලාභීන් රැකියාගත කිරීමට කටයුතු කරන බව. | අපේක්ෂිත අරමුණු ළඟාකරගත හැකි පරිදි ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2020 වර්ෂයේදී සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ රු.1,887,827 ක් වැයකර ප්‍රජාවගේ ආර්ථිකය ඉහළ නැංවීම සහ ප්‍රජාවට සෞඛ්‍යාරක්ෂිත ආහාර ලබාගැනීමේ අවස්ථාවක් ලබාදීම අරමුණු කරගෙන හෙළ බොජුන්හලක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර වසර 02කට අධික කාලයක් ගතවී ඇතත්, එම ගොඩනැගිල්ල අරමුණුගත කාර්යය සඳහා යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | 2024 වර්ෂය සඳහා ක්‍රියාත්මක අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිමකිරීම සඳහා රු.මි.2ක ප්‍රතිපාදන ලබාගැනීමට යෝජනා අනුමැතියට ඉදිරිපත් කර ඇත. හම්බන්තොට මහා නගර සභාවේ අධීක්ෂණය යටතේ ව්‍යවසායකත්ව සංගමය වෙත බොජුන්හලේ කටයුතු පවත්වාගෙන යාමේ වගකීම පැවරීමට එකඟතාවයකට එළඹ ඇති බව. | ව්‍යාපෘති තුලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගත යුතුය. |
| (ඈ) | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේදී ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ගොවි සංවිධානයකට ලබාදී තිබුණු රු.477,543ක්වූ කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍රයක්, ඉලෙක්ට්‍රික් මෝටර් දෙකක් සහ ජල ටැංකියක් 2023 නොවැම්බර් 03 දින වන විටත් අරමුණුගත කාර්යයන් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම උපකරණ වෙනත් සංවිධානයකට ලබාදීමේ අරමුණින් සුදුසු වෙනත් සංවිධානයක් නම්කර දෙන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථානය දෙකකට දැනුවත් කර ඇති බව හා එම ආයතන විසින් නම් කරනු ලබන සංවිධානයකට උපකරණ ලබාදීමට කටයුතු කරන බව. | ව්‍යාපෘති තුලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගත යුතුය. |

## 3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 තුල 2018 හා 2019 වර්ෂවල ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ලබාදුන් අරමුදලින් ග්‍රාම ශක්ති සමිති නමින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් 111ක 2023 දෙසැම්බර් 31 දිනට රු.33,629,869ක මුදලක් වසර 03කට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක ග්‍රාම ශක්ති සමිති 13ක් විසින් චක්‍රීය ණය ක්‍රමය යටතේ ලබාදී තිබුණු රු.5,144,225 ක ණය මුදලින් 2023 දෙසැම්බර් 31 දිනට රු.1,282,212ක ණය මුදලක් හා රු.52,824 හිඟ පොළිය ලෙස එකතුව රු.1,335,036ක මුදලක් අය කරගෙන නොතිබුණි. | ග්‍රාම ශක්ති සමිති ක්‍රියාත්මක වීම කාලයක් අක්‍රීයව පැවතියද මේ වන විට අක්‍රීය සමිති , සක්‍රීය කිරීම හෝ විසුරුවා හැර රජයේ මුදල් වෙනත් සමිති වලට මාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. 2024 පෙබරවාරි මාසය අවසාන වන විට හිඟ ණය මුදල රු.1,104,225ක් සහ පොළිය රු.44,551 දක්වා අඩු වී ඇති බව. | වෙන්කර ඇති මුදල් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු අතර, අප්‍රමාදව නියමිත කාලය තුලදී ණය ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලුණුගම්වෙහෙර නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම . | | |
| (i) | ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත් ආයතනයක් විසින් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු රු.113,816,772ක මිලක් ඉදිරිපත්කර තිබුණු අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම ආයතනය ඉදිරිපත් කර තිබුණු ලංසු සුරක්ෂණය ප්‍රමිතගත නොවන බව දක්වා එම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. එසේ වුවද, එය 2006 රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 7.8(ඇ) වගන්තිය අනුව ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමට තරම් හේතුවක් නොවන බැවින් සහ 7.9.2 (ග) වගන්තිය අනුව, ලංසුවල අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් ලංසුකරුගෙන් කරුණු පහදා ගැනීම සඳහා ඉල්ලීමක් කළහැකි වුවත්, එසේ කටයුතු නොකර, එකී ලංසුව ප්‍රතික්ෂේප කර, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 11.05ක | පිළිගත් ආකෘතියට අනුව ලංසු සුරක්ෂණය ඉදිරිපත් කරන ලෙස දන්වා තිබියදී උපදෙස් පැහැර හැරීම හේතුවෙන් තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ලංසු සුරක්ෂණය පිළිගෙන නොමැත. මෙම ව්‍යාපෘතියේ පළමු අදියරේ කොන්ත්‍රාත් ගිවිසුම පැහැර හැර අත්හැර දමන ලද එකකි. තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුව ක්‍රියාකර ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් අපේක්ෂිත අරමුණු ඉටු වන බව සහතික වන ආකාරයට කටයුතු කළ යුතු අතර, සිදුවී ඇති පාඩුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැඩිමිලක් සහිතව රු.127,587,772 ක මිලක් ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත් සමාගමකට පිරිනැමීම තුලින් රජයට රු.13,771,092ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ii) | ගොඩනැගිල්ලෙහි ඉහල මාලයේ ලී වේදිකාව (Timber Stage) ඉදිකිරීම සඳහා රු.2,694,989ක කොටස් මුදලක් ගෙවා තිබුණද, යොදා ඇති ලී ඇදවීම්, පලුදු වීම් හා ලී හොඳ තත්ත්වයේ නොවීම නිසා 2023 අගෝස්තු 17 දරන විගණන අවස්ථාව වන විට නැවත ගලවමින් පැවතුණි. එමෙන්ම වේදිකාව ඉදිකිරීමට ආනයනික දැව යොදාගැනීම සඳහා ගෙවිය හැකි මුදල රු.2,480,950ක් වුවද, රු.2,584,433ක් ගෙවීම නිසා රු.200,230ක් වැඩිපුර ගෙවා තිබුණි. | ලී අතර විඩාවන් නිරීක්ෂණය වීම හේතුවෙන් වේදිකාවේ ලී ගලවා නැවත සකස්කර ඇත. කොන්ත්‍රාත්කරු විසින් ගෙන එන ලද ලී වල වටිනාකම වැඩිවීම හේතුවෙන් වැඩිපුර මුදලක් වැඩබිමේ ඇති භාණ්ඩ යටතේ ගෙවා ඇති බව. | ගිවිසුම්ගත හා ඇස්තමේන්තුගත පරිදි ඉදිකිරීම් කර නොතිබියදී ගෙවීම් නොකළ යුතු අතර, වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. |
| (iii) | ගොඩනැගිල්ලේ පළමු අදියරේදී, වහලය ඉදිකිරීම සඳහා අවශ්‍ය කාප්ප 05 ඉදිකර තිබියදී සදොස් ලෙස දෙවන අදියරේදීද ඒ සඳහා රු.1,688,750ක් ඇස්තමේන්තු කර තිබුණු අතර, කොන්ත්‍රාත්කරු රු.3,809,000කට එකඟ වී තිබුණි. නිසි අධ්‍යයනයකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට සියයට 20ක අත්තිකාරම් මුදල් ලෙස රු.761,800ක් වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි. | වැඩ බිමේ පැවති කාප්ප පළමු කොන්ත්‍රාත්කරු විසින් සකසන ඒවා වේ. ඔහු විසින් වහලය නොගැසීම හේතුවෙන් මේ සඳහා මුදල් ගෙවීම සිදුනොකරන ලදී. දෙවන වර වැඩ ඉටුකරන අවස්ථාවේදී පළමු කොන්ත්‍රාත්කරු ඒවා රැගෙන ගොස් නොතිබු බැවින් භාවිතයට ගෙන ඇති බව. | වැඩිපුර අත්තිකාරම් ගෙවීමට සිදුවීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iv) | එක් එක් බිල්පත්වලට අදාළ වැඩ කාලපරිච්ඡේදය නිවැරදිව හඳුනා නොගෙන මිල වැඩිවීම් ගෙවීම නිසා බිල්පත් 03කින් එකතුව රු.160,658ක් වැඩිපුර ගෙවා තිබුණි. | XV වන බිල්පත මගින් කොන්ත්‍රාත්කරුට අවාසිසහගත වන ලෙස ජුනි මස දර්ශකය යොදාගෙන බිල්පත් සකස්කරන ලදී. අවසන් බිල්පතේ සියලුම දර්ශක නැවත පරීක්ෂාකර, නිවැරදිව ගෙවීම් සිදුකිරීම භාවිතා කරන ක්‍රමවේදය වන අතර, XV වන බිල්පතෙන් එලෙස සියල්ල පරීක්ෂා කර ගෙවීම් නිර්දේශ කර ඇති බව. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | ගොඩනැගිල්ලෙහි වැසිකිළි තුල බිම් උළු (Floor tile) ඇතිරීමේදී ඇස්තමේන්තුව සහ ගිවිසුම අනුව කටයුතු නොකර වෙනස් කළ වැඩ (variation work) යටතේ වෙනත් ප්‍රමාණයක බිම් උළු ඇතිරීම සඳහා ගෙවීම් කිරීම නිසා කොන්ත්‍රාත්කරු එකඟ වූ මිලට වඩා රු.984,948ක් වැඩිපුර ගෙවා තිබුණි. | රටේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය මත අපේක්ෂිත වර්ගයේ ටයිල් මිලදී ගැනීමට නොහැකි විය. ඒ අනුව වෙළඳ පොලේ පැවති අඩි 2x4 ටයිල් මිලදීගෙන ඉදිකිරීම් කටයුතු කර ඇති බව. | කොන්ත්‍රාත්කරු එකඟවූ පරිදි වැඩ විෂයය ඉටු නොකිරීම හේතුවෙන් රජයට සිදුවී ඇති පාඩුව අයකරගත යුතු අතර, වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (vi) | කළුගල් බැම්ම ඉදිකිරීම සඳහා දරන ලද වියදම රු.287,162ක් වුවද, මිල වැඩිවීම් රු.735,058ක් ගෙවා තිබුණි. එය ඉටුකළ වැඩ වටිනාකමට සාපේක්ෂව සියයට 256ක අසාමාන්‍ය මිල වැඩිවීමක් බවත්, ඒ අනුව කළුගල් සඳහා බර තැබීම් නිවැරදිව ගණනය කර වැඩිපුර ගෙවා ඇති මුදල අයකරගත යුතු බවත් නිරීක්ෂණය විය. | මිල වැඩිවීම් ගෙවීමේ ක්‍රමවේදය අනුව කරනලද කාලය තුල පමණක් ගෙවීමේ හැකියාවක් නොමැත. මුලදී තීරණය කරනු ලබන ප්‍රතිශත අනුව CIDA ආයතනය විසින් හඳුන්වාදී ඇති ක්‍රමවේදය අනුව ගෙවීම් නිර්දේශ කිරීම දිස්ත්‍රික් ඉංජිනේරු විසින් සිදුකරනු ලබන බව. | වැඩ විෂයයන් සඳහා මිල වැඩිවීම් ගෙවීමට නිසි පරිදි බර තැබීම් කළයුතු අතර, එසේ නොකිරීම මත වැඩිපුර ගෙවා ඇති මුදල් අයකරගත යුතුය. |
| (vii) | ඇස්තමේන්තු ගත පරිදි වැඩ විෂයයන් ඉටු නොකිරීම සහ යෙදවුම් සඳහා බර තැබීම් සිදු නොකිරීම මත මිල වැඩිවීම් සඳහා ගෙවීම් කිරීමේදී බිම් උළු (Floor tile), ව්‍යුහාත්මක වැරගැන්වීම් (Structural Steel) ඇලුමිනියම් දොර ජනෙල් සහ දැව යන වැඩ විෂයයන් සඳහා එකතුව රු.9,967,761 ක් වැඩිපුර ගෙවා තිබුණි. | බිම් උළු සඳහා වැඩිපුර ගෙවීම් XV බිල්පතින් අඩුකර ඇති බව, අනෙකුත් වැඩ විෂයයන් සඳහා මිල වැඩිවීම් ගෙවීම් ක්‍රමවේදය අනුව කරනලද කාලය තුල පමණක් ගෙවීමේ හැකියාවක් නොමැත. මුලදී තීරණය කරනු ලබන ප්‍රතිශත අනුව CIDA ආයතනය විසින් හඳුන්වාදී ඇති ක්‍රමවේදය අනුව ගෙවීම් නිර්දේශ කිරීම දිස්ත්‍රික් ඉංජිනේරු විසින් සිදුකරනු ලබන බව.<br><br>අනුමත කරනු ලබන සිමෙන්ති වර්ගයක් භාවිතා කිරීමට කොන්ත්‍රාත්කරුට හැකියාවක් ඇත. එබැවින් භාවිතා කරනු ලබන්නේ M1,M2,M3 යන ඕනෑම වර්ගයකට පොදුවන M4 කාණ්ඩය බව. | වැඩිපුර ගෙවීම් සිදුකළ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගතයුතු අතර, වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (viii) | 2023 මැයි 31 දින වන විට වැඩබිමෙහි නොතිබුණු භාණ්ඩ වර්ග 23ක් සඳහා ඒවායේ වටිනාකමින් සියයට 80ක් සහ එම භාණ්ඩ සඳහා මිල වැඩිවීම් ගණනය කර රු.8,563,471 මුදලක් කොන්ත්‍රාත්කරුට කලින් ගෙවීමට කටයුතු කර තිබුණි. | XV වන බිල්පතෙන් නිවැරදි කර ඇත. බිල්පත් ලැබෙන අවස්ථාව වන විට අදාළ භාණ්ඩ වැඩබිමෙහි නොතිබූ නමුත්, බිල්පත පරීක්ෂා කර නැවත ලබාදෙන අවස්ථාවේ භාණ්ඩ වැඩබිමට ලැබී තිබීම හේතුවෙන් ගෙවීම් නිර්දේශ කර ඇති බව. | බිල්පත් ඉදිරිපත් කරන දිනට සත්‍ය වශයෙන්ම වැඩබිමේ තිබෙන භාණ්ඩ සඳහා පමණක් ගෙවීම් කළයුතුය. |
| (ix) | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු රු.127,587,894කට එකඟ වී සියයට 20ක අත්තිකාරම් ලෙස රු.25,302,572ක් ගෙවා තිබුණද, කොන්ත්‍රාත්කරු ඉටු කිරීමට එකඟ වී තිබුණු රු.47,094,286ක් වූ වැඩ විෂයයන් 191ක් ඉටු නොකිරීම හේතුවෙන් රු.9,418,857ක් වූ අත්තිකාරම් මුදල් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | අත්තිකාරම් මුදල් ගෙවනු ලබන්නේ මුල් කොන්ත්‍රාත් මුදලින් ප්‍රතිශතයක් ලෙසය. ගිවිසුමට අනුව හා පවතින ක්‍රමවේදය අනුව කටයුතුකර ඇති බව. | ඉටු නොකරන වැඩ විෂයයන් වෙනුවෙන් ගෙවීම් කළ අත්තිකාරම් අප්‍රමාදව අයකළ යුතුය. |
| (x) | ගිවිසුම්ගත පරිදි පූර්ණකාලීනවම ඉංජිනේරුවරයකු වැඩබිම තුළ අධීක්ෂණ කටයුතු සිදු නොකළද රු.1,080,000ක එකඟ වූ සම්පූර්ණ වැටුපම ගෙවා තිබුණි. | ව්‍යාපෘති දෙක අනපේක්ෂිත ලෙස එකම කොන්ත්‍රාත්කරුවෙකු සමග ගිවිසුම්ගත වී තිබීමෙන් එම ආයතනයේ ඉංජිනේරු වෙත කර්මාන්ත දෙකම අධීක්ෂණය කිරීම අප විසින් අනුමත කරන ලදී. 2022 ඔක්තෝබර් මස දක්වා ලුණුගම්වෙහෙර කර්මාන්තයෙන් ගෙවීම් සිදුකර ඇත. | ගිවිසුම් කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | අඟුණුකොළපැලැස්ස නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - II අදියර. | | |
| (i) | රු.202,233,895ක ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 11.06ක මිල වැඩිවීමක් සහිතව මධ්‍ය ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම ඉදිරිපත් කළ රු.224,616,800ක මිල ගණන් යටතේ සෘජුවම එම සමාගමට පැවරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී තිබුණි. එසේ | මුල් ඇස්තමේන්තුවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඇස්තමේන්තුව යළි සංශෝධනය කර ඇත. 2021 වර්ෂයේ දෙවන | අමාත්‍ය මණ්ඩලය නිර්දේශ කළ මිල වැඩිවීම් සීමාව ඉක්මවා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා |

| | | | |
|---|---|---|---|
| | වුවද, වෙන් කරනු ලබන සංශෝධිත ප්‍රතිපාදන මත නැවත සකස් කළ රු.58,658,156ක ඉංජිනේරු ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 30.5ක මිල වැඩිවීමක් සහිතව රු.76,604,246කට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත දිස්ත්‍රික් ලේකම් විසින් කොන්ත්‍රාත්තුව පවරා තිබුණු නමුත්, ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු සහ අමාත්‍ය මණ්ඩල නිර්දේශ ලබාගෙන නොතිබුණි. | භාගයේ මිල ගණන් පාදක කරගෙන එය සකස්කර ඇත. කොන්ත්‍රාත්කාර මධ්‍යම ඉංජිනේරු පුද්ගලික සමාගමේ ඉල්ලීම පරිදි සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන ලදී. | නොගෙන පැවරීමට වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | තරඟකාරී ලංසු ක්‍රමය භාවිතා නොකර සෘජුවම මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගමට ඉදිකිරීම් කටයුතු පැවරීම හේතුවෙන් ලාභාංශ ප්‍රතිශතය සියයට 27ක් ලෙස දක්වා ඒකක මිල ගණනය කිරීම හේතුවෙන් රු.68,646,596ක් වූ මුළු වැඩ වටිනාකමින් සියයට 7ක් වූ රු.3,783,670ක අතිරේක ලාභයක් කොන්ත්‍රාත් සමාගමට හිමිව තිබූ අතර, එම ප්‍රමාණයෙන් රජයට පාඩුවක් සිදුව තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ප්‍රමාණ පත්‍රයට ඇතුළත් සියලුම වැඩ අයිතමයන්ගේ මිල ගණන්, මිල විශ්ලේෂණයන් අමාත්‍යාංශය යටතේ ඇති ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර එහිදී එම මිල ගණන් පරීක්ෂාකර අදාළ අවකරණයන් සමඟින් සංශෝධනය කරන ලද මිල ගණන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම ආයතනයට ලාභ ලැබිය නොහැකි අතර අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කර ඇති බව. | රජයේ මුදල් අරපිරිමැස්මෙන් භාවිතා කළයුතු අතර, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | කොන්ත්‍රාත්කරුට රු.15,290,849ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණද, ඉටු කිරීමට එකඟ වී තිබුණු රු.27,635,879ක් වූ වැඩ විෂයයන් 40ක් ඉටු නොකිරීම හේතුවෙන් රු.5,527,176ක අත්තිකාරම් මුදල් වැඩිපුර කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | අත්තිකාරම් මුදල් ගෙවනු ලබන්නේ මුල් කොන්ත්‍රාත් මුදලින් ප්‍රතිශතයක් ලෙසය. ගිවිසුමට අනුව හා පවතින ක්‍රමවේදය අනුව කටයුතුකර ඇති බව. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළයුතු අතර, ඉටු කිරීමට අපේක්ෂිත වැඩ විෂයයන් සඳහා පමණක් අත්තිකාරම් ගෙවිය යුතුය. ඉටු නොකරන වැඩ විෂයයන් සඳහා ගෙවන ලද අත්තිකාරම් අප්‍රමාදව අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | ඉදිකර තිබුණු ගොඩනැගිල්ලෙහි බිත්තිවල ස්ථාන 72ක එකතුව මීටර් 79.7ක පිපිරීම්ද, කොන්ක්‍රීට් කුළුණක මීටර් 0.7ක පිපිරීමක්ද, වැසිකිළි බිත්තියක මීටර් 3.6ක පිපිරීම්/ ඉරිතැලීම්ද නිරීක්ෂණය විය. | ගඩොල් හා කොන්ක්‍රීට්වල ප්‍රසාරණ සංගුණකය වෙනස්වීම හේතුවෙන් මෙම පිපිරීම් සිදුවී ඇත. රඳවුම් මුදල් ගෙවීමට පෙර මෙම අඩුපාඩු සකස් කර ගැනීමට කටයුතු කරන බව. | සැලකිය යුතු අඩුපාඩු පැවතියදී ගෙවීම් නොකළ යුතුය. |
| (v) | ගොඩනැගිල්ලෙහි බිම් මහලේ සහ පළමු මහලේ ගෙබිමේ ස්ථාන 24ක එකතුව වර්ග මීටර් 366.79ක පිපිරීම් / ඉරිතැලීම් සිදුව තිබුණද, ඒ කෙරෙහි අවධානය යොමු නොකර ගෙබිම සිමෙන්ති මැදීම වෙනුවෙන් රු.3,794,920ක්වූ සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි. | රඳවුම් මුදල් ගෙවීමට පෙර මෙම අඩුපාඩු සකස්කර ගැනීමට කටයුතු කරන බව. | සැලකිය යුතු අඩුපාඩු පැවතියදී ගෙවීම් නොකළ යුතුය. |
| (vi) | ව්‍යාපෘතියේ අවසාන ගෙවීම් බිල්පත අනුව, ගෙවන ලද රු.17,592,958ක් වූ මිල වැඩිවීම්වලින් එකතුව රු.9,455,432ක් බිම් උළු (Floor tiles), ව්‍යුහාත්මක වැරගැන්වීම් (Stroctural Steel), ඇලුමිනියම් දොර සහ ජනෙල් ප්‍රාථමික පිරිවැය යටතේ වන වැඩ විෂයයන්, සිමෙන්තිවල යෙදවුම් වර්ගය නිවැරදිව තෝරා නොගැනීම හා බිල්පත් කාලපරිච්ඡේදය නිවැරදිව හඳුනා නොගැනීම යන කරුණුවලට අදාළව සිදුකර ඇති වැඩිපුර ගෙවීම් බව නිරීක්ෂණය විය. | යෙදවුම් ප්‍රතිශත ඉංජිනේරු ඇස්තමේන්තුව උපයෝගී කරගෙන සකස් කර ඇත. වෙනස් කළයුතු අවශ්‍යතාවයන් සම්පූර්ණ වී නොමැති බැවින් ප්‍රතිශත වෙනස් නොකර ගෙවීම් කර ඇත. ප්‍රාථමික පිරිවැය මත වූ වැඩිපුර ගෙවීම ඉදිරි බිල්පත් මගින් සංශෝධනය කරමි.<br>අනුමත කරනු ලබන සිමෙන්ති වර්ගයන් භාවිතා කිරීමට කොන්ත්‍රාත්කරුට හැකියාව ඇත. එබැවින් අදාළ කාර්යය සඳහා වූ M4 පොදු කාණ්ඩය භාවිතා කරනු ලබයි. එමෙන්ම<br>VI බිල්පත ඉදිරිපත් කිරීමේදී නොවැම්බර් දර්ශකය ප්‍රසිද්ධ කර නොතිබුණු අතර, වැඩ අවසන් කිරීමෙන් පසු නිකුත් කරන බිල්පත මගින් එම දර්ශක යොදා ගනිමින් ගෙවීම් කිරීමට නියමිත බව. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතු අතර, මිල වැඩිවීම් ලෙස කොන්ත්‍රාත්කරුට වැඩිපුර මුදල් ගෙවීමට කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vii) | 2022 දෙසැම්බර් 31 දිනට වැඩ නිමකළ යුතුව තිබූ ගොඩනැගිල්ලේ දෙවන අදියරේ ගිවිසුම් ගතවූ කාලය දින 243කින් දීර්ඝ කිරීමේදී එම දින දීර්ඝය නිසා ගෙවිය යුතු වන මිල වැඩිවීම් වටිනාකම ඉහළ යාම පිළිබඳව අවධානය යොමු නොකර ගිවිසුම් කාලය දීර්ඝ කර තිබීම හේතුවෙන් ගිවිසුම්ගත මුදලින් සියයට 23ක් වූ රු.17,592,958ක් මිල වැඩිවීම් ලෙස ගෙවා තිබුණි. | 2022 වර්ෂයේ රටේ පැවති ආර්ථික අර්බුදය මත භාණ්ඩ හිඟ වීම හා සපයාගැනීමේ අපහසුතාවය යන කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ කරුණු පිළිබඳව ඉංජිනේරුවරයා සෑහීමකට පත්වී ඇති බැවින් දින දීර්ඝ කිරීම කර ඇති බව. | ගිවිසුම් කාලය දීර්ඝ කිරීමේදී රජයට දැරීමට සිදුවන අමතර වියදම සැලකිල්ලට ගෙන රජයේ මුදල් අරපිරිමැස්මෙන් භාවිතා වන පරිදි කාලය දීර්ඝ කිරීම කළයුතුය. |
| (viii) | කොන්ත්‍රාත් ගිවිසුම අනුව, ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සඳහා පූර්ණකාලීනව ඉංජිනේරුවරයෙකු යොදවා නොගෙන ලුණුගම්වෙහෙර ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කරන ඉංජිනේරුවරයාම එම කාර්යය සඳහා යොදා තිබීම නිසා ඉංජිනේරු වැටුප් ලෙස ගෙවා තිබුණු රු.299,000ක මුදල වැඩිපුර ගෙවීමක් බව නිරීක්ෂණය විය. | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ව්‍යාපෘතිය සඳහා ගෙවීම් සිදුකළ මාසයන්හි අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපාති කටයුතු සඳහා ගෙවීම් සිදුකර නොමැත. | කොන්ත්‍රාත් ගිවිසුම අනුව පූර්ණකාලීනව ඉංජිනේරුවරයෙකු යොදවා නොතිබීම නිසා වැටුප් ලෙස වැඩිපුර ගෙවා තිබූ වටිනාකම අයකර ගත යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳරක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 03ක පරීක්ෂාවට ලක්කල කැටගල් වලින් සියයට 12.5, 25ක් හා 50ක් බැගින් අසමත්ව තිබියදී, ඒ පිළිබඳ අවධානය යොමු නොකර, එම මාර්ග 3හි කැටගල් ඇතිරීම වෙනුවෙන් එකතුව රු.2,364,133 ක මුදලක් ගෙවා තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ලබාදී ඇති DSH/DPS/14/pro/meeting /2020 ලිපිය හා ඇමුණුමෙහි උපදෙස්වලට අනුව මෙම ව්‍යාපෘතිවලට ගෙවීම් කරන ලද බව. | ඇස්තමේන්තුවේ සඳහන් පරිදි ගිවිසුම්ගත ආකාරයට කාර්යයන් ඉටුකර ඇති බව පරීක්ෂා කර ගෙවීම් කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 (අ) ඡේදය අනුව, වටිනාකමින් අඩු, වහාම ලබාගත හැකි භාණ්ඩ, සම්මත පිරිවිතර ඇති වටිනාකම අඩු භාණ්ඩ මිලදී ගැනීම සඳහා වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යොදා ගත හැකි වුවද, | එකවර වතුර මෝටර් විශාල ප්‍රමාණයක් මිලදී ගැනීමට අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් හා 2022 වර්ෂයේ කාර්තු වශයෙන් ගිණුම් පියවීමේ කටයුතු සිදුකළ | ව්‍යාපෘති සඳහා මිලදී ගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව වඩාත් සුදුසු |

| | | | |
|---|---|---|---|
| | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේදී එකතුව රු.5,265,824 ක්වූ ජල පොම්ප 118ක් මිලදී ගැනීමේදී හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තරුණ කෘෂි ව්‍යවසායකත්ව නියමු ව්‍යාපෘතිය සඳහා එකතු වටිනාකම රු.63,787,698ක් වූ භාණ්ඩ මිලට ගැනීමේදී ජාතික තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යොදා ගෙන මිල කැඳවා තිබුණි. | බැවින් කඩිනමින් මිලදී ගැනීම් සිදු කළයුතු නිසා ජාතික තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව මිලදී ගැනීම සිදුකර ඇත.<br><br>ව්‍යාපෘති සඳහා අවශ්‍ය බොහොමයක් භාණ්ඩ ආනයනය කර සපයා සවිකිරීමද සිදුකළ යුතු බැවින් ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කිරීමට තරුණ කෘෂි ව්‍යවසායකත්ව නියමු ව්‍යාපෘතිය සඳහා එකවර මිල කැඳවීම් සිදුකර ඇති බව. | ප්‍රසම්පාදන ක්‍රමය තෝරා ගත යුතුය. |
| (ආ) | 2020 මාර්තු 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 35 අනුව, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ භාණ්ඩ ප්‍රසම්පාදන කටයුතු සඳහා වන අධිකාරී සීමාවන් පිළිවෙලින් රු.මි. 10ක් හා රු. මිලියනයක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ලුණුගම්වෙහෙර, කටුවන හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකී සීමාවන් අභිබවා අවස්ථා 22 කදී රු.72,079,992ක් වටිනා උපකරණ මිලට ගෙන තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකළ ව්‍යාපෘති සඳහා අවශ්‍ය බොහොමයක් භාණ්ඩ ආනයනය කළයුතු වීම, ඇතුළුව ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කිරීමට සිදුවීම හේතුවෙන් ව්‍යාපෘති සියල්ල සඳහාම එකවර මිල කැඳවීම් සිදුකර ඇති බව,<br>ලුණුගම්වෙහෙර හා කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉදිරියේදී ප්‍රසම්පාදන කමිටු සීමාවන් පිළිබඳ විමසිල්ලෙන් කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇති බව හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ක්‍රියාත්මක කිරීමට තිබූ විශාල ව්‍යාපෘති සංඛ්‍යාව හේතුවෙන් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය ලබාගැනීමට නොහැකි වී ඇති බව. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව නිලධාරීන් කටයුතු කළ යුතුය. |
| (ඇ) | මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණයේ 2023/2024 වර්ෂය සඳහා පවිත්‍රතා සේවා සැපයීමේ කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ දකුණු පළාත් නියෝජ්‍ය කම්කරු කොමසාරිස් නිර්දේශ | 2018 වර්ෂයේ පරිපාලන සංකීර්ණයේ තෘණභූමි සඳහා ජලය සැපයීමේ ව්‍යාපෘතියට සම්බන්ධ වෙමින් පිළිගත නොහැකි බිල්පත් ඉදිරිපත් | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණු, අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුගේ ලංසුව ප්‍රතික්ෂේප කර 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 ඡේදයට අදාළ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 7.9.2 (ඔ) ඡේදය යටතේ දක්වා ඇති විධිවිධාන අනුව කටයුතු නොකර, අවම තුන්වන මිල ඉදිරිපත් කළ ආයතනය තෝරා ගැනීම හේතුවෙන් රු.1,871,829ක පාඩුවක් සිදුවී තිබුණි. | කිරීම මත ඇති වූ විශ්වාසනීයභාවය සම්බන්ධ ගැටළුවක් හේතුකොටගෙන එම ආයතනයේ මිලගණන් ප්‍රතික්ෂේප කර ඇත. | කටයුතු කළ යුතුය. |
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නගාසිටුවීම සඳහා යෝජිත ගෘහාශ්‍රිත එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය. | | |
| | i. ඇස්තමේන්තුගත පිරිවැය රු.17,910,000ක් වූ මෙම ව්‍යාපෘතිය සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ඡේදය අනුව ජාතික තරඟකාරී ලෙස මිල ගණන් කැඳවිය යුතු වුවද, ඊට අනුකූල නොවන ලෙස වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණු අතර, පිරිවිතර ඇතුළත් විධිමත් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| | ii. ප්‍රාදේශීය මිල කැඳවීමේදී මුළු සතුන් අවශ්‍යතාවයෙන් සියයට 69ක් සඳහා ලංසු ඉදිරිපත්වී නොතිබුණු අතර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් සතුන් 139 දෙනෙකු මිලදීගෙන තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සතුන් මිලදීගත යුතුය. |
| | iii. සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී යොදාගත යුතු විකල්ප මිලගණන් 03ක් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. ඒ අනුව දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමත මිලගණන්වලට වඩා වැඩි මිලගණන් ගෙවා තිබුණු බැවින් රු.1,540,661ක රාජ්‍ය මුදල් බාහිර පාර්ශවයන් වෙත වැඩියෙන් ගෙවා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | රජයට සිදු වී තිබෙන අලාභය නැවත අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන හා සමෘද්ධි ජීවනෝපාය වැඩසටහන සඳහා වඩු මැෂින් මිලට ගැනීමේදී, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 වගන්තියට පටහැනිව, එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා රු.2,472,000ක් වූ වඩු මැෂින් 16ක් මිලට ගෙන තිබුණි. | ආනයන සීමා හේතුවෙන් සෘජුවම ආනයනය කර බෙදා හරින ආයතනයකින් මිලදී ගැනීමට තීරණය කළ බව. | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඊ) | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 ගම සමඟ පිළිසඳරක් වැඩසටහන සහ සමෘද්ධි ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2021 සඳහා මිලදී ගෙන තිබුණු රු.838,100ක් වූ වතුර මෝටර් 18ක් පිරිවිතරවලට අනුකූල නොවූ ඇණවුම් කළ වර්ගයේ නොවන වතුර මෝටර් බව නිරීක්ෂණය විය. | ඇණවුම් කළ වර්ගයේ වතුර මෝටර් මිලදී ගැනීමට රටතුළ පැවති භාණ්ඩ හිඟය නිසා වෙළඳ පොළේ නොතිබීමෙන් ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි භාණ්ඩ සපයාගෙන ඇති බව හා ප්‍රතිපාදන වෙන් වූ ප්‍රමාණයන් මත මිලදී ගෙන ඇති බව. | පිරිවිතරවලට අනුකූලව භාණ්ඩ මිලදී ගැනීම කලයුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයට පෙර බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබුණු වසර 10කට වඩා වැඩි කාලයක් භාවිතයට නොගෙන ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින ජෙනරේටර් 02ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක් ජෙනරේටරයක් භාවිතයට නොගන්නා අතර, එක් ජෙනරේටරයක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | වත්කම් අරමුණුගත කාර්යයන් සඳහා යොදාගත යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ත්‍රීරෝද රථයක් හා යතුරු පැදියක් පිළිවෙලින් වසර 10ක හා 05ක කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | යතුරු පැදියේ ලියාපදිංචි අයිතිය දිස්ත්‍රික් ලේකම් වෙත පවරාගෙන ඉදිරි කටයුතු සිදුකරන අතර, ත්‍රීරෝද රථය මෝටර් රථ පරීක්ෂක වෙත ඉදිරිපත් කර වාර්තා කළ පසු ඉදිරි පියවර ගන්නා බව. | වත්කම් අරමුණුගත කාර්යයන් සඳහා යොදාගත යුතුය. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන 2021 යටතේ කැලියපුර මැටි ආශ්‍රිත කර්මාන්තකරුවන්ගේ සමිතිය සඳහා රු.769,000ක් වැයකර මිලදීගත් යන්ත්‍රයේ පිරිවිතර, ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාව සමඟ නොගැලපීම හේතුවෙන් හා නැවත නැවතත් දෝෂයන්ට ලක්වීම නිසා 2023 ජූලි මාසයේ සිට එම යන්ත්‍රය භාවිතයෙන් ඉවත් කර තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොමැති බවත්, යන්ත්‍රය සඳහා දරන ලද රු.769,000ක මුදල නිෂ්කාර්ය වියදමක් වී ඇති බවත් නිරීක්ෂණය විය. | යන්ත්‍රයේ යාන්ත්‍රික ක්‍රමවේදයේ යම් වෙනසක් සිදුකිරීම සඳහා අවධානය යොමුකරන ලෙසත්, යන්ත්‍රය යථා තත්ත්වයට පත්කොට සමිතිය වෙත භාරදීමෙන් පසු ප්‍රගතිය වාර්තා කරන බව. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගතයුතුය. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ සහ වී තොග බැහැර කිරීමේ වැඩසටහනට අදාළ භාණ්ඩාගාර ලේකම්ගේ අංක DFD/2023-I දරන 2023 පෙබරවාරි 09 දිනැති චක්‍රලේඛයේ 2.3.5 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් වී තොගවල සත්‍ය තෙතමන ප්‍රතිශතය වෙනුවට සියලු වී තොගවල තෙතමන ප්‍රතිශතය සියයට 22 ලෙස තීරණය කර තිබුණි. ඒ අනුව මිලදීගෙන තිබුණු සෑම තෙත වී කිලෝග්‍රෑම් 100 කින් කිලෝග්‍රෑම් 12.5 බැගින් වී කිලෝග්‍රෑම් 10,340,983 කින් වී කිලෝග්‍රෑම් 1,292,623 ක් තෙතමනය සඳහා කපා හැරීමට කටයුතු කර තිබුණු අතර එසේ කපා හැර තිබුණු වී වල ගැනුම් වටිනාකම රු.113,750,824 ක් වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | වී මිලදී ගැනීම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භාණ්ඩාගාර ලේකම්ගේ අංක DFD/2023-I දරන 2023 පෙබරවාරි 09 දිනැති චක්‍රලේඛයේ 3.1.3 ඡේදය සහ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MWCA&SE/Add.Sec/01/AD01/119/ 2022 දරන 2023 මාර්තු 23 දිනැති ලිපියෙහි 04 වන ඡේදයට පටහැනිව සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රවාහන වියදම් සඳහා ගැලපීම් සිදුනොකර වී කෙටීමේ කුලී ගණනය කර තිබුණු බැවින් වී කෙටීමේ කුලී ලෙස රු.1,700,760 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ උපදෙස් අනුව ප්‍රවාහන වියදම් සඳහා වූ ගැලපීම් කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10ක් විසින් විශ්‍රාමිකයින් 29 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද එකතුව රු.6,025,880ක මුදලින් රු.3,407,938ක විශ්‍රාම වැටුප් 2023 දෙසැම්බර් 31 දිනට අයවීමට පැවතුණි. | අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024.03.31 රු.21,995ක් අයකර ඇති බව. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. |
| (ඈ) | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් විසින් ලිපියක් මගින් 2008 වර්ෂයේදී කිතලලන්ද ප්‍රදේශයේ හෙක්ටයාර් 4.6122කින් යුත් ඉඩමේ භුක්තිය කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත ලබාදී වසර 15කට අධික කාලයක් ගතවී ඇතත්, 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ නියෝග 218 ප්‍රකාරව පැවරුම් නියෝගයක් මගින් ප්‍රාදේශීය සභාව වෙත පැවරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ආයතන වල නිර්දේශ ලද වහාම ඉදිරි කටයුතු සිදුකරන බව. | 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ නියෝග 218 ප්‍රකාරව පැවරුම් නියෝගයක් මගින් ප්‍රාදේශීය සභාව වෙත පැවරීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | කර්මාන්ත අමාත්‍යාංශය වෙත කර්මාන්තපුරයක් ස්ථාපනගත කිරීමට යෝජිත සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සුරුවිරුගම වැලිආර නම් අක්කර 20ක් පමණ ඉඩමේ තිබී බාහිර පාර්ශවයක් විසින් කපාගෙන ගොස් තිබුණ කොහොඹ ගස් 22ක, තේක්ක ගස් 04ක, බුරුත ගස් 03ක සහ කිරිල්ල ගසක තක්සේරු වටිනාකම වූ රු.246,296ක රජයේ නිලධාරීන්ගේ නොසැලකිලිමත් බව නිසා රජයට සිදුව ඇති පාඩුව, මුදල් රෙගුලාසි 119 ප්‍රකාරව අයකරගත යුතු බවට නිරීක්ෂණය විය. | මෙම ගැටළුව සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කර ඇති අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් විමර්ශන කටයුතු සිදුකෙරේ. පොලිස් පැමිණිල්ලට අදාළව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සිදුකරනු ලබන විමර්ශනයේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදුකරන බව. | සිදුවූ පාඩුව මුදල් රෙගුලාසි 119 ප්‍රකාරව අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | හම්බන්තොට පරිපාලන සංකීර්ණයට යාබදව ඉදිකර ඇති රජයේ නිවාස 12 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන ජල සැපයුමෙන් සපයන ලද ජලය වෙනුවෙන් වර්ෂ 01 සිට වර්ෂ 09 ක් අතර කාලපරාසයට අදාළව 2023 ජුනි 13 දිනට එකතුව රු.1,905,190ක ජල ගාස්තු අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | නියමිත පරිදි ජල ගාස්තු අයකරගත යුතුය. |
| (උ) | 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනතේ 07 වන වගන්තිය ප්‍රකාරව තිස්සමහාරාම, සූරියවැව, හම්බන්තොට හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම සම්බන්ධයෙන් අනවසරකරුවන් 08 දෙනෙකු වෙත නෙරපීමේ නියෝග ලබාදී තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු වසර 01ත් 03ත් අතර, කාලයක සිට ප්‍රමාද වෙමින් පවතින බව නිරීක්ෂණය විය. | තිස්සමහාරාම හා සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මේ පිළිබඳව සොයා බලා ඉදිරි කටයුතු සිදුකරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව, හා ලුණුගම්වෙහෙර හා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල නඩු තීන්දුවේ පිටපතක් ලබා ගැනීමෙන් පසු නෙරපීමේ නියෝගය ක්‍රියාත්මක කරන බව. | නෙරපීම් නියෝග හා නඩු තීන්දුවල නියෝග ඉදිරි අනුව ක්‍රියාමාර්ග සිදුකළ යුතුය. |

**4. යහපාලනය**

**මහජනයා වෙත සේවා ඉටු කිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (I) හා 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් රාජ්‍ය ආයතන මගින් මහජනයාට ලබාදෙන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ලබාදීමේ අරමුණින් සියලුම රාජ්‍ය ආයතන විසින් තම ආයතන සඳහා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය, හඳුන්වාදිය යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්බලන්තොට, තිස්සමහාරාම, ඕකෙවෙල, සූරියවැව හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පුරවැසි ප්‍රඥප්තිය යාවත්කාලීන කර නොතිබුණි. | පුරවැසි ප්‍රඥප්තිය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව. | පුරවැසි ප්‍රඥප්තිය යාවත්කාලීන කර, ප්‍රදර්ශනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය අනුව, කොස් ගස් කැපීමට බලපත්‍ර ලබාදීම වෙනුවෙන් අනුමැතිය ලබාදීම සඳහා දින එකක් ගතවන බව දක්වා තිබුණද, 2021 වර්ෂයේදී වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අයදුම්කරුවකු කොස්ගස් හෙළීමට ඉදිරිපත් කළ අයදුම්පතක් සඳහා 2024 පෙබරවාරි 20 දින වන විටත් බලපත්‍රය ලබාදී නොතිබුණි. 2023 වර්ෂයේදී තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අයදුම්කරුවකු ඉදිරිපත් කර තිබුණ අයදුම්පතක් සඳහා 2024 පෙබරවාරි 13 දින දක්වා බලපත්‍රය ලබාදීම ප්‍රමාද වී තිබුණු බව නිරීක්ෂණය විය. | යම් අතපසුවීමක් සිදුවී ඇති බව පිළිගන්නා අතර, ඉදිරියේදී සේවාලාභී ප්‍රඥප්තිය අනුව කටයුතු කරන ලෙස අදාළ පාර්ශවය දැනුවත් කරන ලද බව. | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු හම්බන්තොට වාණිජ කලාපයට ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් පදිංචිකරුවන් 112 දෙනෙකුට නිවාසද, 07 දෙනෙකුට නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම්ද ලබාදී වසර 17කට ආසන්න කාලයක් ගතවී ඇතත්, එම දේපලවලට හිමිකම් කීම සඳහා විධිමත් ලියවිල්ලක් ලබාදී නොතිබුණි. | නිවාස 67ක් අන්සතුකර හා පදිංචි නොමැති අතර ඉතිරි ඉඩම්ලාභීන් 52 දෙදෙනා වෙනුවෙන් දීර්ඝකාලීන බදුකර සෑදීමට සැලසුම් කළද ඔවුන් නිදහස් දීමනා පත්‍ර ලබාදෙන ලෙස ඉල්ලීම් කිරීමෙන් එය ලබාදීමේ හැකියාව සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් විමසා ඇති බව. | දේපල සඳහා හිමිකම් පතක් ලබාදිය යුතුය. |
| (ඇ) | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019, 2020, 2022 හා 2023 වර්ෂවල ඉඩම් කච්චේරිවලින් හඳුනාගත් අයදුම්කරුවන් 35 දෙනෙකු වෙත සකස්කර තිබුණු බලපත්‍ර හා ගැනුම් මිල මත ලබාදීමට සකස්කර තිබුණු බලපත්‍ර 08ක් 2023 නොවැම්බර් 06 දින වන විටත්, බලපත්‍රලාභීන් වෙත බෙදාදීමට කටයුතු නොකිරීමෙන් රජයට අයවිය යුතු ආදායම්ද අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | බලපත්‍ර ලාභීන්ට ඒවා ලබාදීමට දැනුවත් කර ඇතත්, සහභාගී වී නොමැත. ඉදිරියේදී සොයාබලා කටයුතු කරමි. | නිකුත් කර ඇති බලපත්‍ර අදාළ බලපත්‍ර ලාභීන්ට ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත කාර්යය මණ්ඩල හා තථ්‍ය කාර්ය මණ්ඩල තොරතුරු අනුව ද්විතියික ශ්‍රේණියේ තනතුරුවල අතිරික්තතා 64ක් නිරීක්ෂණය විය. | පවතින අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට ගන්නා ලද පියවරක් ලෙස අංක DSH/ADM/11/2/14 හා 2021.11.20 දිනැති ලිපිය මගින් සංවර්ධන නිලධාරී අනුමත කාර්ය මණ්ඩලය 96ක ප්‍රමාණයකින් වැඩිකර දෙන මෙන් ඉල්ලා ඇති බව. | අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වසර 05ක් ඉක්මවා එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබාදිය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12ක නිලධාරීන් 579 දෙනෙකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක වී ඇති බැවින් වසර 05ක් ඉක්මවූ සේවා කාලයක් පවතින නිලධාරීන් 40කට අධික ප්‍රමාණයක් සේවා ස්ථානවලින් ස්ථාන මාරුවී ගොස් ඇති බව. | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කළයුතුය. |